**විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව**

| | | |
|---|---|---|
| ස්ථානය | :- | රඹුක්කන ප්‍රාදේශීය සභාව |
| දිනය | :- | 2025.06.11 |
| වේලාව | :- | පෙ.ව. 10.00 |

**සහභාගීත්වය**

ගරු සභාපති ,
1. ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,
2.ඒ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

3. වයි.ජී.ජයවීර මැතිතුමා
4. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
5. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
6. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
7. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
8. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
9. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
10. කේ.සී.සරත් කුමාර මැතිතුමා
11. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
12. ජේ.පී.පද්මසිරි මැතිතුමා
13. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
14. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
15. එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
16. එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
17. ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා
18. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
19. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
20. වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය
21. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
22. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
23. පී.ජී.මල්ලිකා මැතිතුමිය
24. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
25. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
26. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
27. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
28. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
29. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
30. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
31. එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය
32. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය

**නිලධාරී සහාභාගීත්වය**

❖ ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

**ආගම සිහිකිරීම**

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

❖ **ගරු සභාපති** ආර්.එම්.එස්.එස්.බි.රත්නායක **මැතිතුමා**

වර්ෂයේ ඉදිරි මාස සඳහා මහ සභාව පැවැත්වෙන දින තිරණය කීරිම

2025.06.20
2025.07.08
2025.08.05
2025.09.02
2025.10.08
2025.11.04
2025.12.02

යන දිනයන් සුදුසු බව **ගරු සභාපති** ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා **විසින් යෝජනා** කල අතර එම **යෝජනාව එම්.වි. ප්‍රියන්ත එදිරිසූරිය** මැතිතුමා **විසින් ස්ථිර කරන ලදි.**

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **ගරු සභාපති** ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

**කාරක සභා පිළිබඳව පිළිබඳව දැනුවත් කීරීම**

- **I. මුදල් හා ප්‍රතිපත්ති සැකසීම**
- **II. නිවාස සහ ප්‍රජා සංවර්ධනය**
- **III. කාර්මික සේවා**
- **IV. පරිසර සහ පහසුකම්**

❖ **යන කමිටු සඳහා මන්ත්‍රී 38 දෙනාගෙන් එක් කාරක සභාවකට උපරිම මන්ත්‍රීන් 10 දෙනෙකු සහ බාහිර පුද්ගලයින් 05** දෙනෙකු සුදුසු බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බි.රත්නායක **මැතිතුමා විසින් යෝජනා කල අතර එම්.වි. ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

❖ ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී** එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා

**කමිටු සඳහා සාමාජිකයින් පත්කීරිමේදී මන්ත්‍රී මණ්ඩලයට අමතරව බාහිර පාර්ශවයෙන් ගනු ලබන සාමාජිකයින් සම්බන්ධව දැන ගැනිමට කැමති බවත්,මින් පෙර බාහිර පුද්ගලයින් කමිටු සඳහා යොදා නොගත් බවත් ප්‍රකාශ කරන ලදි.**

❖ ගරු **සභාපති** ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

**අපි මෙතෙන්ට ආවේ විභාග ලියල නෙමේ.මහජන ඡන්දෙන් තේරි පත් වූ අපි එම විශ්වාසය රැකිය යුතු බවත් , උපදේශක මණ්ඩලය සඳහා බාහිර පාර්ශවය යොදා ගැනිම සභාපති බලතල අනුව හැකියාව ඇති බවත්, උපදේශක මණ්ඩලය සඳහා බාහිර පාර්ශවය යොදා ගැනීමෙන් සභාවේ ලේකම්ට සහ කාර්යය මණ්ඩලයට හෝ කිසිදු පාර්ශවයකට අගතියක් නොවන බවට වග බලා ගන්නා බවත් ප්‍රකාශ කරන ලදි.**

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ජ්.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

කමිටු සඳහා බාහිර පුද්ගලයන් පත් කිරිමේදී නිර්නායක මොනවාද යන්න පිලිබඳ දැනුවත් කරන ලෙසත් කමිටු සමාජිකයන් සඳහා මන්ත්‍රීවරු පමණක් ප්‍රමාණවත් බවත් සඳහන් කරන ලදි.ඉතිහාසය පුරා කිසිදු අවස්ථවක බාහිර පාර්ශ්වයන් සම්බන්ධ කර නොගත් බව ප්‍රකාශ කරන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

පනතට අනුව බාහිර පාර්ශවය සම්බන්ධ කර ගත හැකි බැවින් ක්ෂේත්‍රයේ නිපුණ පුද්ගලයින් පත් කිරීමටත් ඔවුන් හට කිසිදු ගෙවීමකින් තොරව සේවය ලබා ගැනීමට අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කරන ලදි.සභාවේ විශාල ප්‍රශ්න ගණනාවක් ඇති බවත්, අපට දැවැද්දක් ලෙස විශාල කුණු කන්දක් තබා ඇති බවත් අද සභාවේ පළමු දවස බැවින් සියලුදෙනා සහෝදරත්වයෙන් ඉදිරි අවුරුදු හතර අප හට සහයෝගය දක්වනු ඇතැයි බලාපොරොත්තු වන අතර අපි අපේ දේශපාලන සංස්කෘතිය ඉහළින්ම පිළිගන්නා බවත්, ජනාධිපති අනුර කුමාර සහෝදරයාගේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම අපගේ එකම අරමුණ බවත් පවසන ලදි.න්‍යාය පත්‍රයට අනුව විශේෂ මහ සභාවේ කටයුතු මෙපමණයි බව ගරු සභාපතිතුමා විසින් පවසන ලද අතර මීළඟට මන්ත්‍රී මණ්ඩලය හඳුනා ගැනීමේ වාරය බව ප්‍රකාශ කරන ලදි.

කමිටු පත් කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ ගරු උප සභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා

මා පරපේ කොට්ඨාශය නියෝජනය කරමින් මන්ත්‍රීවරයකු වශයෙන් තේරීපත් වූ අතර මා හට ඡන්දය ලබාදුන් සියලු ජනතාවට මේ අවස්ථාවේ ස්තූතිය පුදකරන අතර වෘත්තියෙන් සිවිල් ඉංජිනේරුවරයකු වන අතර පූර්ණ කාලිනව සභාවේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරන බවත්,වසර 76 ක ආරාජික යුගය අවසන් කරමින් පොහොසත්, ලස්සන රටක් සෑදීමට සහයදුන් ජනතාවට නැවත වරක් ස්තූතිවන්ත වෙමින් රඹුක්කන ජනතාව හොඳ සේවයක් කිරීමට බලාපොරොත්තු වන බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**

මා ඉඹුල්ගස්දෙණිය කොට්ඨාශය නියෝජනය කරමින් සභාවට තේරීපත් වූ අතර මා තෝරා පත් කර ගත් ඉඹුල්ගස්දෙණිය කොට්ඨාශයේ ජනතාවට ස්තූතිවන්ත වන බවත් මාගේ එකම අරමුණ පොහොසත් රටක් ගොඩනැගීමටත්,රෝහණ විජේවීර සහෝදරයාගේ මහ පෙන්වීම යටතේ සේවයට කැපවන බවත්, නායකත්වයට සහයෝගය ලබාදෙන බවත් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

වෘතීයෙන් තාක්ෂණවේදියෙක් වන මම දෙස් විදෙස් රට වලට මාගේ සේවය ලබා දුන් බවත්, මා මන්ත්‍රීවරයෙක් වශයෙන් තෝරා පත් කර ගත් ඊරියගොල්ල ජනතාව ස්තූතිවන්ත වන අතර ඉදිරි සංවර්ධන කටයුතු වලටත්,ලස්සන රඹුක්කනක් ගොඩනැගීමට සහය වන බවත් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩබ්.එන්.සුරංජනි සෝමදාස මැතිතුමිය**

මා තෝරා පත් කරගත් වැලිගමුවේ ජනතාවට ස්තූතිවන්ත වන අතර පොහොසත් රටක් ,ලස්සන ජීවිතයක් තේමා කරගනිමින් සංවර්ධන කටයුතු සඳහා සියලුම සහයෝගය හා කැපවීමෙන් කටයුතු කරන බවත්, පූර්ණ කාලිනව වශයෙන් දේශපාලන සහයෝගය ලබා දෙන බවත් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.දසනායක මැතිතුමා**

මා **ප්‍රාදේශීය සභාවට තෝරා පත් කරගත් ජනතාවට** ස්තූතිවන්ත වන අතර දියුණු නගරයක්, ලස්සන රඹුක්කනක් දියුණු ජනතාවක් වෙනුවෙන් අපි සහයෝගයෙන් වැඩ කරමු. අලුත් දේශපාලන සංස්කෘතියක් හඳුන්වා දෙමු. යනුවෙන් අදහස් දක්වන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහමම්දූ සුක්රි මැතිතුමා**
මා වෘත්තිය වශයෙන් ගුරුවරයෙක් වන අතර මා තෝරා පත් කරගත් ජනතාවට ස්තූතිවන්ත වන අතර අපි කණ්ඩායමක් වශයෙන් වැඩ කරමු. රඹුක්කන දියුණුව වෙනුවෙන් කටයුතු කරමු. ඉන්පසු දෙමළ බසින් සභාව අමතන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා**
මා දැලිවල කොට්ඨාශය නියෝජනය කරන අතර මා වෘත්තියෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විශ්‍රාමිකයකි.මා තෝරා පත් කර ගත් කොට්ඨාශයේ ජනතාවට ස්තූතිවන්ත වන අතර අපි කණ්ඩායමක් වශයෙන් එකතු වී වැඩ කරමු යැයි පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත මැතිතුමා**
මොලගොඩ කොට්ඨාශයේ ජනතාවට මා තෝරාපත් කර ගැනිම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වන අතර රටේ ඇති වූ ආර්ථික තත්වය හමුවේ පැරණි දේශපාලනය ඉවත් කළයුතු බව සිතූ ජනතාව මා තෝරා පත් කළ බවත්,මොලගොඩ ජනතාව වෙනුවෙන් සේවයක් කිරිමට කැප වී සිටින බවත්,අපි දේශපාලනයට පැමිණේන්නේ ජනතාවට සේවය කිරිමට බවත්, පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා**
මා යුධ හමුදාවේ වසර 22 ක සේවයක් කර විශ්‍රාම ලබා ඇති අතර දුනුකේවල කොට්ඨාශයට මා තෝරා පත් කර ගැනිම සම්බන්ධයෙන් සියලුමදෙනාට ස්තූතිවන්ත වන අතර රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යයන් ඉටුකිරිමට ඇප කැප වන බවත් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**
මා යුධ හමුදාවේ සේවය කර පූර්ණ කාලින වශයෙන් දේශපාලනයට පැමිණි බවත්, මා තෝරා පත් කර ගත් කිරිවන්දෙණිය කොට්ඨාශයේ ජනතාවට ස්තූතිවන්ත වන අතර ඔවුනගේ බලාපොරොත්තු ඉටු කිරිමට කැප වන බවත් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.ප.පත්මසිරි මැතිතුමා**
මම නාවික හමුදාවේ විශ්‍රාමික අයෙක් වන අතර පූර්ණ කාලින වශයෙන් දේශපාලනයට පැමිණි බවත්, මා හට ඡන්දය ලබාදුන් ආදරණීය ජනතාවට ස්තූතිවන්ත වන අතර රටේ පැවති අයහපත් පැවැත්මත් සමඟ නව දේශපාලන සංස්කෘතියක් අවශ්‍ය වූ බවත් රඹුක්කන ලස්සන නගරයක් කිරිමට ඔබගේ සහයෝගය බලාපොරොත්තු වන බවත් ලස්සන නගරයක් ගොඩනගමු. යනුවෙන් අමතන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා**
වැව්ලි සමාගමක සුපරීක්ෂක වරයෙක් වන මම හේවාදිවෙල කොට්ධාශයට මන්ත්‍රීවරයකු වශයෙන් තෝරාපත් කර ගැනිම සම්බන්ධයෙන් සියලුමදෙනාටම ස්තූතිවන්ත වන අතර රට වෙනුවෙන් යමක් කිරිමටත්, ජනතාව බලාපොරොත්තු වන කාර්යයන් ඉටුකිරිමටත් කැපවී සිටින පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය**
මා තෝරාපත් කරගත් නාරම්බැද්ද ජනතාවට ස්තූතිවන්ත වන අතර ඔවුන් වෙනුවෙන් සේවය කිරිමට කැපවී සිටින බවත් පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා**
  මා වෘත්තීන් කිහිපයක් කර දැනට පූර්ණ කාලින වශයෙන් දේශපාලනයේ නිරතව සිටින අතර මා තෝරාපත් කරගත් වල්ගම කොට්ඨාශයේ ජනතාවට ස්තූතිවන්ත වන අතර ඔවුන්ගේ සිතුම් පැතුම් බලාපොරොත්තු ඉටුකරන බවත්, රඹුක්කන ලස්සන නගරයක් කිරිමට කැපවන බවත් ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන් ක්‍රිශාන්ත සේනාරත්න මැතිතුමා**
  මා ටෙලිකොම් ආයතනයේ තාක්ෂණික නිලධාරියෙක් වන අතර දූෂණ වංචාවෙන් තොර ලස්සන රටක් ගොඩනැගිමට ඡන්දය ලබාදුන් සියලුදෙනාට ස්තූතිවන්ත වන අතර රඹුක්කන ජනතාවට ලස්සන ජීවිතයක් ගත කිරිමට ඇපකැප වී වැඩ කරන බවත් පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා**
  මා කෙරෙහි විශ්වාසය තබා ජන්දය ලබා දුන් සියළු දෙනාට ස්තූතිවන්ත වන අතර පක්ෂ විපක්ෂ භේද අතහැර අපි සියළුදෙනාම එක් වී ලස්සන රඹුක්කන නගරයක් ගොඩ නඟමු යැයි පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා**
  **මා ව්‍යාපාරිකයෙක් වන අතර මා තෝරා පත්කර ගත් ජනතාවට ස්තූතිවන්ත වන අතර රඹුක්කන ජනතාවටත් සභාවේ කටයුතු වලටත් පූර්ණ සහයෝගය ලබා දෙන බවත්, ඒ වෙනුවෙන් පූර්ණ කාලීනව කැප වන බවත් පවසන ලදි.**

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**
  මහජන පරීක්ෂකවරයෙක් වන මම දුම්කොළ හා මද්‍යසාර සම්බන්ධ උපදේශකවරයකුද වේ.ජනතාව විසින් කරනු ලබන පෙරළියත් සමඟ ජනතාගේ බලාපොරොත්තු ඉටුකරන බවත්, මා හට ජන්දය ලබාදුන් සියලුදෙනාට ස්තූතිවන්ත වන අතර පක්ෂ භේදයකින් තොරව ජනතා බලාපොරොත්තු ඉටුකරන බවත් පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි වී.ආර්.වී.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය**
  මා අලෙවි විධායක නිලධාරිනියක් වන අතර මන්ත්‍රීවරියක් වශයෙන් මා තෝරාපත් කර ගැනිම සම්බන්ධයෙන් කුඩාගම ජනතාවට ස්තූතිවන්ත වන අතර පොහොසත් රටක් ලස්සන ජීවිතයක් සඳහා ඉදිරි කාලයේදී උපරිමයෙන් සේවය කරන බවටත් පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
  1997 වසරේ ආරම්භ වූ මාගේ දේශපාලන ගමන 2011 වසර දක්වාම මාව තෝරා පත් කර ගත් ජනතාවට ස්තූතිවන්ත වන බවත්,රටේ අලුත්ගමනක් සඳහා අනුර කුමාර ජනාධිපතිතුමාගේ සංකල්පයට අනුව වැඩ කිරිම සඳහා එක්සත් ජාතික පක්ෂයෙන් මන්ත්‍රීන් හතර දෙනෙක් තෝරාපත් කිරිමට උදව් කළ සියලුදෙනාටම ස්තූතිවන්ත වන අතර සමන්ත රණසිංහ චම්පිකා ප්‍රේමදාස ,සන්දීත් සමරසිංහ,මංජුල බෝගහවත්ත මැතිතුමාටත් ස්තූතිවන්ත වන අතර වසර හතරක කාලයක් රඹුක්කන ජනතාවගේ වැඩ කටයුතු කිරිම සඳහා සහයෝගය ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදි.ප්‍රාදේශිය සභා පනත ,සභා ප්‍රාදේශීය සභා රීති පොත මන්ත්‍රීන්ට ලබාදිමට කටයුතු කරන ලෙසත්,ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ මොහොමඩ් අනීස් මැතිතුමා**

  මා හට ඡන්දය ලබාදුන් හුරීමළුව,මොට්ටප්පුලිය,මීදුම ජනතාවට ස්තූතිවන්ත වන අතර මා වෘත්තියෙන් ව්‍යාපාරිකයෙක් වන අතර මා ජනතාව වෙනුවෙන් ඇපකැප වී සේවය කරන අතර මුස්ලිම් නොව සියලු ජාතින් සමඟ එකතු වී වැඩ කරන බවටත්, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සහ චම්පිකා මැතිතුමාගේ නායකත්වයෙන් ගිවිසුම් අත්සන් කර දින 11 ක් වැනි සුළු කාලයක් තුළ මාගේ ඡන්ද ව්‍යාපාර කටයුතු සිදු වුවත් ජනතාව මා ඡන්දයෙන් තෝරා පත්කර ගනුලැබුවා. මා පෙර කළ යෝජනා මෙතෙක් ඉටුවීනොමැත මට අයත් මීදුම කොට්ඨාශයද පිහිටා ඇත්තේ දුරින් බවත්, එය මට අවාසිදායක තත්වයක් හෙයින් එය නිවැරදි කිරිමක් කරන ලෙසත් ඉල්ලා සිටි අතර රඹුක්කන ජනතාවගේ අඩුපාඩු සොයා බලා සියලුදෙනා සමඟ සහයෝගයෙන් කටයුතු කරන බවටත් පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය**

  මීට පෙර වසර 05 ක කාලයක් සභාවේ සේවය කළ අතර රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් කාන්තා නියෝජනය සඳහා තෝරාපත් ගැනිම සම්බන්ධයෙන් වල්ගම ජනතාවට ස්තූතිවන්ත වන අතර ජාතික ජනබලවේගය පක්ෂය කොට්ඨාශ 21 ම ජයග්‍රහණය කළ ඔබතුමාලාට අපගේ සහයෝගය ලබාදෙන බවත්, ඉදිරි වසර හතරක කාලය සභාවේ වැඩ කටයුතු සාර්ථකව කර ගෙන යමු. ලෙස ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා**

  මා ලංකා විදුලි බල මණ්ඩලයේ සේවය කරන අතර අපහට ඡන්දය ලබාදුන් මොලගොඩ කොට්ඨාශයේ හා රඹුක්කන ජනතාවට ස්තූතිවන්ත වන අතර ඔබතුමන්ලාට සහයෝගය ලබාදෙන බවත්,වැරදි තැන්වලිදී විරුද්ධ වන බවත් රඹුක්කන ජනතාවට වැඩකිරිමට ඔබතුමන්ට ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

  මා දේපළ වෙළදාම් සමාගමක සේවය කරන අතර ඡන්ද 6333 ක් ලබාදී මන්ත්‍රීවරයකු වශයෙන් තෝරාපත් කර ගැනිම සම්බන්ධයෙන් රඹුක්කන ජනතාවට ස්තූතිවන්ත වන අතර මා හට අවස්ථා දෙකක් සභාව නියෝජනය කිරිමට අවස්ථාව ලැබුණු බවත්,රඹුක්කන ලස්සන නගරයක් කිරිමට සියලුදෙනාගේම සහයෝගය ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

  මා හට ඡන්දය ලබාදුන් සියලුදෙනාට ස්තූතිවන්ත වන අතර සභාවේ ඉදිරි කටයුතු වලට සභාපතිතුමාට සහයෝගය ලබාදෙන බවත්, පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

  දෙවන වතාවටත් සභාවට තේරිපත් වීම සම්බන්ධයෙන් සතුටු වන අතර වැඩිම ඡන්ද ප්‍රමාණයකින් ජයග්‍රහණය කලේ මා නිහතමානිව වැඩ කළ නිසයි. වෛරී දේශපාලනයෙන් තොර ඉදිරිගමනක් යමු.මෙම සභාව ලංකාවේ හොදම සභාව බවට පත් විය. නැවතත් ලංකාවේ හොදම සභාව බවට පත් කරමු. යැයි පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.එස්.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා**

  මා තෝරා පත් කර ගැනිම සම්බන්ධයෙන් කුඹල්ඔළුව ජනතාවට ස්තූතිවන්ත වන අතර ජනතාවට උපරිම සේවයක් කිරිමට බලාපොරොත්තු වන බවත්.ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

  මා අහිංසක ස්වාධීන මන්ත්‍රීවරයෙක් මාගේ උත්සහයෙන් තරඟ කර මේ ප්‍රාදේශීය සභාවට තේරීපත් විය. එම නිසා කුඩාගම ජනතාවට ස්තූතිවන්ත වන අතරම තියුණු තරඟයක් ලබාදී මම කුඩාගම කොට්ඨාශය පරාජය වුනේ මා සභාපතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා ස්වාධීන මන්ත්‍රීවරයෙක් වශයෙන් හරිදේ කිරීමට මම සහයෝගය ලබාදෙනවා.මාගේ කුඩාගම කලාපයට ප්‍රතිපාදන ලබා දෙන ලෙසත්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු නොකරපු වැඩ මා කර ඇති බවත්, වසර හතරක් ඇතුළත රඹුක්කන සුරපුරයක් කරන්න ශක්තිය ධෛර්ය ලැබෙවා කියා පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ආර්. කිත්සිරි සුමන රත්න මැතිතුමා**

  මා තෝරා පත්කර ගත් ඡන්දදායකයින්ට ස්තූතිවන්ත වන අතර ඉදිරි කටයුතු වලට ඔබට සහයෝගය ලබාදෙන බවත්, ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ආර්.ප්‍රදීපා රංජනි මැතිතුමිය**

  මා වෙනුවෙන් ඡන්දය ලබාදුන් සියලුදෙනාටම ස්තූතිවන්ත වන අතර මාගේ පක්ෂයේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට ද ස්තූතිවන්ත වන අතර ඔබතුමාගේ ප්‍රදානත්වයෙන් සිදුකරන ප්‍රාදේශීය සභාවේ කටයුතු වලට සහයෝගය ලබා දෙන බව පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

  තිස් වසරක යුද්ධය අවසන් කර මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පක්ෂයෙන් ඉදිරිපත් වීමත් නාමල් රාජපක්ෂ මැතිතුමා, අතුල හඳගම මැතිතුමා,තරංග මන්ත්‍රීතුමා අතුළු සියලුදෙනාටත්,රඹුක්කන ජනතාවටත් ස්තූතිය පුද කරන අතර සභාපතිතුමා ඇතළු සියලුදෙනාටම සහයෝගය ලබාදෙන බවත්, ප්‍රකාශ කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

  සියලු මන්ත්‍රීන් හට ස්තූතිය පුදකළ අතර රෝහණ විජේවීර සහෝදරයාගේ ප්‍රතිපත්තිවලට අනුව ඉදිරි කාර්යය භාර්ය සිදුකිරීමටත්,ඔහු ප්‍රකාශ කළ මිනිසුන්ගේන් සුරානොකා පුද්ගලික බලාපොරොත්තු නොව මහජන යහපත උදෙසා වැඩ කරමු යැයි පවසන ලදි.වසර 60 ක් පුරාවට පැවති රජයන් විසින් විවිධ අණපනත් සංශෝධන ගෙන ආවත් ජනතාවට හිතකල පනත් දෙකක් පමණක් ගෙන ඇති බවත්,මාගේ පෙර ධූරකාලය මාස 06 ක් පමණක් බවත් ප්‍රකාශ කරන ලදි. මේවන තෙක් ප්‍රාදේශිය සභාවේ ඉටු නොවූ කාර්යය සඳහා ඔබලාගේ යෝජනා ඉදිරිපත් කරන්න ලෙස දන්වන ලදි. මෙම නවක මන්ත්‍රීන් සභාවට පමණක් ආධුනික බවත්,වැඩ කිරීමට ආධුනික නොවන බවත් පවසන ලදි. මීළඟ සභා වාරය සඳහා මන්ත්‍රී යෝජනා ලබාදෙන ලෙසත්,කමිටු සඳහා නම් යෝජනා කරන ලෙසත්, පොසොන් පොහොය වෙනුවෙන් සුදානම් කර ඇති දන්සල සඳහා සහයෝගය ලබාදිමටත්, 2025.06.12 වන දින පරිසරය පවිත්‍ර කිරීමේ වැඩසටහන සඳහා සහයෝග ලබාදෙන ලෙසත්,පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

  මන්ත්‍රීවරුන් සඳහා නිල මුද්‍රාවක් ලබාදෙන ලෙස යෝජනා කරන ලදි.

- **අවසානය**

  අද දින සභාවේ වැඩකටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය ලබාදුන් මන්ත්‍රී මණ්ඩලයට ,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මාධ්‍යවේදීන්ටත් ස්තූතිය පුද කරමින් විශේෂ මහසභාවේ වැඩකටයුතු පෙ.ව 11.40 ට පමණ අවසන් කරන ලදි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක

සභාපති

රඹුක්කන ප්‍රාදේශීය සභාව

<u>**විශේෂ මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන**</u>

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා**

06 වැනි පිටුවේ සඳහන් වැරදි තැන්වලදී විරුද්ධ වන බවත් ලෙස සටහන් වී ඇති බවත්, එය හොඳවැඩ වලට සහයෝගය ලබා දෙන ලෙස සටහන් විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

05 වැනි පිටුවේ සඳහන් 1997 වසරේ ආරම්භ වු මාගේ දේශපාලන ගමන 2011 වසර දක්වාම ලෙස සටහන් වී ඇතත් එය 1997 වසරේ ආරම්භ වු මාගේ දේශපාලන ගමනට වසර 17 ක් ලෙස නිවැරදි විය යුතු අතර ,සමන්ත රණසිංහ ලෙස සටහන් වී ඇත.එය දේශපාලනයේ හිටපු ගරු මන්ත්‍රීනි සමන්තා කරුණරත්න ලෙස නිවැරදි විය යුතු බවත්,07 වැනි පිටුවේ මන්ත්‍රීවරුන් සඳහා නිල මුද්‍රාවක් ලබාදෙන ලෙස සටහන් වී ඇත. එය මන්ත්‍රීතුමන්ලා සඳහා නිලමුද්‍රවක් හා හැඳුනුම් පතක් ලෙස සටහන් විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය**

06 වැනි පිටුවේ සඳහන් රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් කාන්තා නියෝජනය සඳහා තෝරාපත් ගැනිම සම්බන්ධයෙන් වල්ගම ජනතාවට ස්තූතිවන්ත වන ලෙස සටහන් වී ඇති අතර එය වල්ගම කොට්ඨාශයේ ජනතාවට හා ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ස්තූතිවන්ත වන ලෙස නිවැරදි විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

06 වැනි පිටුවේ සඳහන් ඡන්ද 6333 ක් ලබාදී මන්ත්‍රීවරයකු වශයෙන් තෝරාපත් කර ගැනිම සම්බන්ධයෙන් රඹුක්කන ජනතාවට ස්තූතිවන්ත වන ලෙස සටහන් වී ඇතත් එය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සඳහා 6333 ක ඡන්ද ප්‍රමාණයක් ලබා දුන් රඹුක්කන ජනතාවට හා ගරු හිටපු සභාපති අතල හඳගම මැතිතුමා ඇතුළු කණ්ඩායමට ස්තූතිය ප්‍රකාශ කරන ලෙස නිවැරදි විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස් පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

06 වැනි පිටුවේ සඳහන් දෙවන වතාවටත් සභාවට තේරීපත් වීම සම්බන්ධයෙන් සතුටු වන අතර වැඩිම ඡන්ද ප්‍රමාණයකින් ජයග්‍රහණය කලේ මා නිහතමානිව වැඩ කළ නිසයි. වෛරී දේශපාලනයෙන් තොර ඉදිරිගමනක් යමු.මෙම සභාව ලංකාවේ හොදම සභාව බවට පත් විය. නැවතත් ලංකාවේ හොදම සභාව බවට පත් කරමු. ලෙස සටහන් වී ඇති අතර එය රඹුක්කන ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ කඩිගමුව කොට්ඨාශය ඉතා වසනාවන්ත ඡන්ද කොට්ඨාශයක් වන අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් සිටිම සතුටු දායකයි.පසුගිය පළාත් පාලන මැතිවරණයේදී රඹුක්කන ඡන්ද බල ප්‍රදේශය තුළ එක්සත් ජාතික පක්ෂයට වැඩි ඡන්ද ලබා දෙමින් මා පළමු තැනට පත් කළ කඩිගමුව කොට්ඨාශයේ ජනතාවටත්,උඩුගම ගොන්දැවල ඡන්ද මධ්‍යස්ථනයෙන් මාහට N.N.P. පරදා වැඩි ඡන්ද 121 ක් ලබා දුන් උඩුගම ජනතාවටත්, විශේෂ ස්තූතිය පළ කරමි.මෙවැනි ජයක්ග්‍රහණයක් ලබා ගැනිමට හැකි වුයේ මා නිහතිමානිව වැඩකළ නිසාත්,වෛරී දේශපාලනයෙන් තොර ඉදිරිගමනක් ගොස් රඹුක්කන ප්‍රාදේශිය සභාව නැවතත් ලංකාවේ හොදම ප්‍රාදේශිය සභාව බවට පත් කිරිමට අප සැමගේ සහයෝගය ලබා දෙන බවත් ප්‍රකාශ කරමි. ලෙස නිවැරදි විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ආර්.ප්‍රදීපා රංජනි මැතිතුමිය**

07 වැනි පිටුවේ සඳහන් කරුණ සඳහා ඉදිරිපත් කළ විශේෂ කරුණු සටහන් වී නොමැති අතර ඒ සඳහා මා හට ඡන්දය ලබාදුන් කිරිවන්දෙණිය කොට්ඨාශයේ වසම් පහේ සියලුදෙනාටත්, රඹුක්කන කොට්ඨාශයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජනතාවටත් ස්තූතිය පුද කරන බවට සඳහන් විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ආර්.ප්‍රදීපා රංජනි මැතිතුමිය සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

07 වැනි පිටුවේ සඳහන් නාමල් රාජපක්ෂ මැතිතුමා,අතුල හඳගම මැතිතුමා,තරංග මන්ත්‍රීතුමා ඇතුළු සියලුදෙනාටත්,රඹුක්කන ජනතාවටත් ස්තූතිය පුද කරන ලෙසය. එහි හිටපු සභාපති අතුල හඳගම මැතිතුමා ලෙසත්,රඹුක්කන කොට්ඨාශයේ පොදුජන පෙරමුණේ සියලුම ජනතාවට ස්තූතිය පුද කරන ලෙස සඳහන් විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ආර්. කිත්සිරි සුමනරත්න මැතිතුමා**

07 වැනි පිටුවේ සඳහන් එම මන්ත්‍රීතුමාගේ ඉදිරිපත් කිරීමට තැපැල්කරුවෙකු වශයෙන් සේවය කළබව සඳහන් වී නොමැති බැවින් එය සටහන් විය යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ආර්. කිත්සිරි සුමනරත්න මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පත්මසිරි මැතිතුමා**

04 වැනි පිටුවේ සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.ප.පත්මසිරි මැතිතුමා ලෙස සඳහන් වි ඇත.එහි 'ප' අකුර ඉවත් කරන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පත්මසිරි මැතිතුමා සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

2025.06.11 දින පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

සත්‍ය පිටපතකි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක
සභාපති
රඹුක්කන ප්‍රාදේශිය සභාව